# ශ්‍රී ලංකාවේ ළමයින් අපචාරවලට යොමු වීම හා අපයෝජනය වීම පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්


කථිකාචාර්ය තාවකාලික
ටී.ජී.ඩී උදයකාන්ති

වත්මන් සංකීර්ණ සමාජ ආර්ථික රටාව තුළ හුදකලා වූ මානුෂිකත්වයෙන් ඔබ්බට ගිය සමාජ අපචාර ක්‍රියා බහුලව සමාජය තුළ දක්නට ලැබේ. ඒ අතර ළමා අපචාර හා අපයෝජනය සුලභ සංසිද්ධීන් දෙකකි. මාධ්‍ය වාර්තා හා කාන්තා හා ළමා කාර්යාංශයේ වාර්තාවලට අනුව දරුවන් අපචාර වලට යොමු වීමේ ශීඝ්‍ර වර්ධනයක් දැකගත හැකි ය.ඒ අනුව ළමයා හඳුනාගෙන ඔහු අපචාරවල යොමු වීමට බලපාන සමාජ පරිසරය හා කාරක හඳුනා ගැනීම තුළ ඒ සඳහා පිළියම් යෙදිය හැකිය.

1989 දී සම්මත කරගන්නා ලද එක්සත් ජාතින්ගේ විශ්ව ළමා ප්‍රඥප්තියට අනුව ළමයා යනු වයස අවු 18 ට අඩු සියලුම තැනැත්තන් ය. මෙය ලංකාව තුළ අර්ථකථනය වන පරිදි 1995 අංක 2 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ ළමයා යන්න අවු 18 ට අඩු තැනැත්තෙක් යන්න ලංකාවේ නීතියට අනුව ගළපා ගෙන ඇත.

ළමා අපචාරයක් යනු ඒ ඒ සමාජ සංස්කෘතීන්ට අනුව ළමයාගේ අධ්‍යාපනයට පෞරුෂය වර්ධනයට යහපත් සමාජානුයෝජනයට හිතකර නොවන ඕනෑම ක්‍රියාවලියක් වේ. එය ළමයා විසින් සිදු කරනු ලබන ක්‍රියාවලියකි. අපචාර හා අපයෝජනය යන්නෙහි වෙනසක් ඇත. අපයෝජනය යනු, යම් පුද්ගලයෙකු හෝ සමූහයක් විසින් ළමයින්ව වැරදි ක්‍රියාවලට පොලඹවා ගැනීමයි. කෙසේ නමුත් අපචාර හා අපයෝජනය අතර ද සබඳතා ඇත. අපයෝජනයට ලක් වූ දරුවකු ඊළඟ වතාවේ දී අපචාරයකට පෙලඹිය හැකිය.

ළමා අපචාර සමබන්ධව සාකච්ජා කිරීමේ දී මූලික වශයෙන් එය පහත පරිදි හඳුනා ගත හැකිය.




ඉහත සඳහන් පරිදි ළමා අපචාර ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැකි ය. එහි ලිංගික අපචාර ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැකි ය. එහි දී ලිංගික අපචාර හා සන්නිවේදන මාධ්‍ය වැරදි භාවිතය තුළ ඉහළ යමින් පවතියි.

දියුණු තාක්ෂණික රාමුවක් තුළ පරිගණක භාවිතය හා ජංගම දුරකථන භාවිතය ඉහළ ගොස් ඇත. ඒ හේතු කොට ගෙන ළමුන් ලිංගික දර්ශන ඇතුළත් වීඩියෝ පට නැරඹීම තුළ මානසික විකෘතිතා මෙන්ම කායික වශයෙන් වැරදි ඇබ්බැහිවීම්වලට ලක් වීම දක්නට ඇත. දරුවන් අතර ප්‍රබල ලෙසම දක්නට ලැබෙන සංසිද්ධියක් වන්නේ සමාජ වෙබ් අඩවි භාවිතය යි. එනම් face Book, Twitter, My Space වැනි සමාජ වෙබ් අඩවි හරහා අසභ්‍ය දර්ශන නැරඹීම සහ දරුවන් මේ සඳහා ඉලක්ක කර ගෙන ඇත. එවන් දර්ශන මිත්‍ර කණ්ඩායම් අතර හුවමාරු කර ගැනීම බහුල වශයෙන් සිදු වේ.

මෙම තත්ත්වය අදවන විට ජනප්‍රිය වෙමින් පවතින අතර පරිගණක භාවිතයට ඉඩ නොදීම මෙයට විසඳුමක් නොවේ. ඒ සඳහා පරිගණක ජාල ගත කරමින් ආරක්ෂිත ක්‍රම පද්ධතියක් හඳුන්වා දීමයි. ඒ තුළ වැරදි භාවිතය අවම වන අතර දෙමවුපිය අවධානය නිරන්තරයෙන් දරුවන් සඳහා යොමු විය යුතුය. නිවසක් තුළ පරිගණකය තැබිය යුත්තේ සියල්ලටම පෙනෙන ස්ථානයක ය. නමුත් බොහෝ නිවෙස් තුළ පරිගණකය තබා ඇත්තේ කාමරයක කෙළවරකය. මෙය යාළුවන් හා එක් වන ළමයා නොමග යෑමට

සුදුසු පරිසරය කි. එසේම දරුවන් වැඩිහිටි වියට පත්වන තුරුම මවුපිය සෙනෙහස දරුවාට අවශ්‍ය වේ.

එසේම ළමා ගණිකා වෘත්තිය ද සංචාරක කලාප ආශ්‍රිතව බහුලව දක්නට ලැබේ. මෙය මූලිකවම අපයෝජනයක් වන අතර දරුවා ඊට ඇබ්බැහි වීමෙන් පසුව එය ළමා වයස් කාණ්ඩ අතර අපචාරයක් ලෙස පැතිරෙයි.

සමලිංගික ක්‍රියා ලිංගික අපචාර ගණයට අයත් වේ. පාසල තුළ සම වයස් කණ්ඩායම් ඇසුර විශේෂයෙන්ම බාලක බාලිකා වශයෙන් වර්ගීකරණය වී හුදෙකලා වූ පාසල් රටාව තුළ සමලිංගික ක්‍රියාවල හැසිරීම් වාර්තා වේ. එමෙන්ම දරුවන් ස්වයං වින්දනයට යොමු වීම ද ලිංගික අපචාර ගණයට අයත් වේ. අසභ්‍ය වීඩියෝ පට අලෙවිය ජනප්‍රිය වී ඇත්තේ ද මෙම ළමා පරපුර අතරේ ය. දරුවන් තුළ කරුණු සෙවීමේ කුතුහලය ප්‍රයෝජනයට ගන්නා ඔවුන් නව යොවුන් වියේ දරුවන් මේ සඳහා ඉලක්ක කර ගෙන ඇත.

ලිංගික අපචාරවලට යොමුවන ළමුන් බහුල වශයෙන් ජනාකීර්ණ ප්‍රදේශවල විශේෂයෙන් මුඩුක්කු පැල්පත් ආශ්‍රිතව දැකගත හැකි ය. අඩු ඉඩකඩක ඇති සංකීර්ණ වටපිටාවක් තුළ වැඩිහිටියන්ගේ ලිංගික හැසිරීම් දැකීම හා රූපවාහිනිය වැනි මාධ්‍යය භාවිතය මෙම පෙලඹවීමට ප්‍රධානම හේතුවයි.

රූපවාහිනී ටෙලි නාට්‍ය නැරඹීමට යොමු වන දරුවා ඒ තුළ ඇති සිපගැනීම් වැනි දර්ශන කුඩා මනස තුළ ද හැඟීම් උද්දීපනය කරයි. ළමා කාටූන් හා ළමා කතන්දර තුළ ද බොහෝ විට තරුණ තරුණියන්ගේ සිද්ධීන් අඩංගු වී තිබීම හා ඒ තුළ සිදුවන දූෂ්සමායෝජනය ළමයින් අපයෝජනයට යොමු වීමට ප්‍රධානතම හේතුව කි.

සමහර දරුවන්ට නිසි වයසට අධ්‍යාපනය ලබන්නට අවකාශ අහිමි වීම තුළ ඔවුන් සීමාවක් නොමැතිව සමාජ ගත වේ. එහි දී ඔවුන්ට ලැබෙන කාලයේ අවකාශය ගත කිරීමට විවිධ උපක්‍රම යොදා ගනී. වීදි දරුවන් විශාල වශයෙන් සමාජ ගත වීම තුළ දක්නට ලැබෙන්නේ ද මෙවන් වාතාවරණය කි. එහි දී බොහෝ දරුවන් සිගමන් යැදීම, පදික වෙළඳාමට යොමු වීමේ බොහෝ වෙළඳුන් ද තම භාණ්ඩ අලෙවිය සඳහා ළමුන් උපයෝගී කර ගනී. මෙය එක් අතකින් අපයෝජනයක් වන අතර ඇබ්බැහියෙන් පසු අපචාරය කි. ළමුන් කෙරෙහි සිත් ඇද ගැනීමේ හැකියාව තිබීම හා පොදු සමාජයේ අනුකම්පාව සහ ආදරය හිමි වීමේ වාසිය ලබාගන්නේ කූට වෙළෙඳුන් ය.

ළමුන් මෙලෙස හුදකලා වීම තුළ ඇති වන සමාජ තිගැස්ම සාධාරණීකරණය කරන්නේ ලිංගික ආස්වාදය තුළිනි. දුගී බව තුළ නිවාස, ඇඳුම් පැලඳුම්, අධ්‍යාපනය වැනි අවශ්‍යතා අහිමි වීම තුළ තම අරමුණු ගත කිරීමට නොහැකි වේ. ඉබාගාතේ යන ළමා මනස මෙම අසංවර ක්‍රියා තුළ සතුටු වනවා විය හැක.

ව්‍යභිචාර ගණයේ ලිංගික ක්‍රියා තුළ දරුවන් අපයෝජනයට ලක් වූ අවස්ථා දක්නට ලැබේ. ලේ ඥාති සබඳතාවක් ඇති වැඩිහිටියන් දරුවන්ව ලිංගික ක්‍රියාවලට යොදා ගැනීම ව්‍යභිචාර ගණයේ ලිංගික අපයෝජනය ලෙස හැඳින්විය හැකි ය.

ලිංගික අපචාරවලට යොමුවන ළමුන් බහුල වශයෙන් ජනාකීර්ණ ප්‍රදේශවල විශේෂයෙන් මුඩුක්කු පැල්පත් ආශ්‍රිතව දැකගත හැකිය. අඩු ඉඩකඩක ඇති සංකීර්ණ වටපිටාවක් තුළ වැඩිහිටියන්ගේ ලිංගික හැසිරීම දැකීම හා රූපවාහිනිය වැනි මාධ්‍යය භාවිතය මෙම පෙලඹවීම්වලට ප්‍රධානතම හේතුවයි.

ළමයින් මත් ද්‍රව්‍යවලට යොමු වීම සමාජීය වශයෙන් සුලභ වන අතර එය පාසල් හා ජනාකීර්ණ නගර වල පෞද්ගලික පන්ති ආශ්‍රිතව ජනප්‍රිය වී ඇත. ළමුන් මත්ද්‍රව්‍ය භාවිතයට පමණක් නොව මත් ද්‍රව්‍ය නිෂ්පාදනය, ප්‍රවාහනය සහ අලෙවියට ද ඔත්තු බැලීමට ද යොමු වේ.

විවෘත ආර්ථිකයත් සමග ලංකාව තුළ මත්ද්‍රව්‍ය භාවිතය ජනප්‍රිය විය. ළමුන් බොහෝ විට යොමු වී ඇත්තේ දුම් වැටි, ගංජා, මත්පෙති, මදන මෝදක, බුලත් විට, කොන්ඩේ සැකසීමට ගන්නා ජෙල් වැනි ළමුන්ට පහසුවෙන් මිල දී ගැනීමට හැකි ද්‍රව්‍ය වලට යි.

දරුවන් මත්ද්‍රව්‍ය වලට යොමු වන්නේ විලාසිතාවක් වශයෙනි. ඔවුන් අනුකරණය කරන්නේ වැඩිහිටියන් ය. එමෙන්ම වැඩිහිටියන්ගේ මත් ද්‍රව්‍ය අළෙවි ව්‍යාපාරවල ඔත්තු කරුවන් වන්නේ දරුවන් ය. ඒ ඔවුන් පොලීසිය හා නීතිය සම්බන්ධ ආයතන විසින් සැක නොකරන බැවිනි.

දුම් වැටිවලට බොහෝ දරුවන් ඇබ්බැහි වීමට නිවස තුළ වටපිටාව ප්‍රබල බලපෑමකි. පියා දුම්වැටි පානය කරන නිවසක දරුවන් ද ඊට යොමු වීමට ඇති ඉඩ කඩ වැඩි ය. තව ද සම වයස් කණ්ඩායම්වලදී එකිනෙකා අබිබවා යන ශක්තීන් උරගා බැලීමට පෙලඹීමේ දී තම සමූහයෙන් මතු වීමට උත්සාහ කරන දරුවා සුවිශේෂී පුද්ගලයෙකු වීම සඳහා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වේ.

දරුවන් මත් ද්‍රව්‍ය අලෙවියට පෙලඹෙන්නේ මුදල් හෝ වෙනයම් ප්‍රතිලාභ හේතුවෙනි. බොහෝ විට මෙවන් පෙලඹවීම් දක්නට ලැබෙන්නේ වෙරළබඩ ප්‍රදේශ, සංචාරක කලාප හා මුඩුක්කු පරිසරය ආශ්‍රිතව යි.

එසේම මත් ද්‍රව්‍ය නිෂ්පාදනයට, මත් ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදා ගන්නේ ළමුන් ය. මත් ද්‍රව්‍යය ජාවාරම්කරුවන්ට ළමුන් වාසි සහගත යෙදවීමකි. එහි දී සුළු වැටුපකට හෝ සන්තෝෂමකට ඔවුන්ව රවටා තම නිෂ්පාදන කාර්ය සිදු කළ හැකි ය. තවද නීතිමය ආයතන ද ඔවුන් සැක නොකරයි.

සමාජය තුළ ළමා අපචාර සංසිද්ධීන් අතර සම්බන්ධතාවක් ඇත. එහි දී සොරකම් කිරීම්, මංකොල්ලකෑම් මිනීමැරුම් සම්බන්ධ අපචාර ක්‍රියාවලට යොමු වීම දක්නට ලැබේ. මෙම ක්‍රියාවලීන් එකිනෙකා හා සම්බන්ධ වේ. එහි දී මත්ද්‍රව්‍ය භාවිතයට පෙලඹුන ළමයෙක් ඒ සඳහා අවශ්‍ය මුදල් සෙවීමට සොරකම් කිරීමට හැකි ය. එසේම ළමුන් සොරකම් හා මංකොල්ලකෑම් වැනි ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමු වීමට ළමා කාටුන් හා චිත්‍රපට හා නාට්‍යවල සඳහන් විවිධ ක්‍රියාවලින් ඔවුන් අත්හදා බැලීමට යාම හේතු වේ.

එසේම ශ්‍රමය විකිණීම සම්බන්ධව බොහෝවිට දරුවන් යොමු වන්නේ දුගී බව නිසා ය. අඩු පිරිවැයට බොහෝ විට වැඩි වැඩ කොටසක් කිරීමට ඔවුන්ට සිදු වේ. එහිදී තමන්ට අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට විවිධ හේතු මත පාසල් කාලය අහිමි වීම තුළ ඇතිවන සමාජ හුදකලාව දුගී බව මෙම පෙලඹවීමට හේතුවන සමාජ කාරකයන් ය.

ළමා අපයෝජනය යනු වැඩිහිටියන් විසින් ළමුන්ව වැරදි ක්‍රියාවලට පෙලඹවීම යි. 1989 ළමා අයිතිවාසිකම් ආඥා පනතට අනුව ළමා අපයෝජනය ළමයින්ට සිදුවන කරදර අකටයුතුකම් යන්න සඳහන් කර ඇත.

එහි දී

1. ළමයින් යුද කටයුතුවලට යොදා ගැනීම.
2. වහල් සේවයට හෝ මෙහෙකාර සේවයට, ශ්‍රම සූරා කෑමට ලක් කිරීම හෝ එසේ වීමට ඉඩහැර සිටීම.
3. අන්තරායක වැඩ කටයුතුවලට කර්මාන්තවලට වෘත්තීයන්ට (රැකියා හෝ ශ්‍රම ලබා ගැනීම) ව්‍යාපෘතීන්ට යොදා ගැනීම (උස්

ස්ථාන, යන්ත්‍ර සූත්‍ර, විදුලිය, ජලය, ගින්දර) අවදානම වැඩ නීති විරෝධී.

4. දරුකමට හදා වඩා ගැනීමට දීම හෝ වහල් සේවයට මෙහෙකාර හෝ ගණිකා සේවයට විකිණීම.
5. මත්ද්‍රව්‍ය මත්පැන්වලට හුරු වීම.
6. අන්තරායක අවි ආයුධ පරිහරණයට හුරු කරවීම හෝ එසේ වීමට ඉඩ හැර සිටීම.
7. මත්ද්‍රව්‍ය, හොර ජාවාරම්, නීති විරෝධී කටයුතු වලට යොදා ගැනීම හෝ පුහුණු කිරිම එසේ වීමට ඉඩ හැර සිටීම.
8. කෲර ලෙස ශාරීරිකව ද මානසිකව ද හිංසා කිරීම.
9. නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමට බාධා කිරීම හෝ ඉඩ ලබා නොදීම.
10. ලිංගික කටයුතුවලට කැමැත්තෙන් හෝ බලහත්කාරයෙන් යොදා ගැනීම.
11. ලිංගික කටයුතුවලට පෙලඹවීමට කැමැත්තක් ඇති වන ලෙස ස්පර්ශ කිරිම සිපවැළඳ ගැනීම, අසභ්‍ය රූප, සඟරා හෝ චිත්‍ර පටි නැරඹීමට සැලැස්වීම හෝ පුද්ගලයකුගේ නිරුවත ළමයෙකුට පෙන් වීම හෝ ස්පර්ශ කිරීමට දීම හෝ ඉඩ හැර සිටීම, දරුවන්ට දර්ශනය වන ලෙස ලිංගික ක්‍රියා වල නිරත වීම.
12. ළමයකු අවදානමට ලක්වන ලෙස ආත්ම ගරුත්වය කෙලෙසන ලෙස උසුළු වසුළු කිරීම, බැන වැදීම, අපහාස කිරීම හෝ නිරුවත් කිරීම.
13. ළමයෙකුගේ ස්වාධීනත්වය, නිදහස අහිමි වීම, සිරකර තැබීම, යදම් වලින් බැඳ තැබීම.
14. නිසි ලෙස ආහාර, ඇඳුම්, සෞඛ්‍ය පහසුකම් ලබා නොදීම.
15. සම වයසේ මිතුරු ඇසුර ක්‍රීඩාවට, විනෝද වීමට ඉඩ නොදී බාධා කර හුදෙකලා කිරීම.
16. මවුපියන්ගෙන්, ඔහුට සහ ඔහු ආදරය කරන අයගෙන් වෙන් කිරීම. (කුරේ. 2005, පි, 18, 19)

උක්ත කරුණුවලට අනුව ළමා අපයෝජනය සිදුවන අවස්ථාවන් හඳුනා ගත හැකි ය. එහි දී යුද්ධය ප්‍රධාන වේ. ලොව බොහෝ

සමාජතල වුව ද අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙන යුද්ධය ලොව දරුණුතම ඛේදවාචකය යි. දෙවන ලෝක යුද්ධයේ දී ජපානයේ හිරෝෂිමා නාගසාකි නගර දෙකට බෝම්බ හෙළීම තළ අද වන තුරුම එහි බලපෑම දක්නට ලැබේ. ඒ තුළින් දරුවන් අංගවිකලභාවයට පත්ව ඇත. එය එක් අතකින් ළමා අපයෝජනය කි එසේම ළමා සොල්දාදුවන් බඳවා ගැනීම ජනමාධ්‍ය නිරාවරණය කළ පරිදි ලංකාව තුළ පැවති LTTE කොටි ත්‍රස්තවාදය තුළ ද ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සිදු විය. ළමුන් තුළ පවතින ආවේගශීලි බව තම වර්ගයා පිළිබඳ හැඟීම, දරුවන්ගේ සුපිරිසිදු මනසේ නම්‍යශීලි බව ඔවුන් තම යුද වාසිය සඳහා යොදා ගත්තේ ය. ඒ තුළ දරුවන්ගේ අයිතිවාසිකම් රැසක් උල්ලංඝනය විය. දරුවන් දෙමවුපියන්ගෙන් වෙන් කිරීම, අධ්‍යාපනය හා ඔහුගේ ළමා කාලය අහිමි වීම යුද්ධය හේතු කොටගෙන අංග විකල බව මානසික හුදකලා බව සමහර අවස්ථාවල ජීවිතය අහිමි වීම වැනි සිද්ධීන් වාර්තා වේ. යුද්ධයේ දී ළමුන්ව තමා ආදරය කරන අය අහිමි වීම තුළින් අනාථභාවයට පත් වේ.

ළමුන් අපයෝජනයට ලක්වන ප්‍රබල අවස්ථාවක් ලෙස ළමා ශ්‍රමිකයන් සඳහන් කළ හැකි ය. බොහෝ විට අප විසින් ළමා අපයෝජනයට ලක් වන අවස්ථාවක් ලෙස හඳුනාගන්නේ ළමා මෙහෙකාර සේවය යි. ලංකාව තුළ මේ තත්වය බහුලව දක්නට ඇත. 1977 විවෘත ආර්ථිකයෙන් පසු ලංකාව තුළ මධ්‍යම පන්තියේ ප්‍රසාරණය මෙයට බලපෑ ප්‍රධානතම හේතුව යි. ඉහළ පන්තිය බොහෝ විට පාරම්පරික ධනවතුන් ය. නමුත් මධ්‍යම පංතිය යනු අධ්‍යාපනය වැනි සාධක හේතු කොට ගෙන මධ්‍යම පංතියට සංචලනය වූ පහළ පංතිය යි. ඔවුන්ගේ ආශාව වන්නේ ඉහළ පංතියේ ගති සිරිත් ආරෝපණය කර ගනිමින් ගමන් ඉහළ පංතියේ යැයි ප්‍රදර්ශනය කිරීම යි. එහි එක් අවස්ථාවක් ලෙස ළමා මෙහෙකාර සේවය සඳහන් කළ හැකි ය. මන්ද යත් ඔවුන් සතු විශාල ධනයක් නැති බැවින් අඩු වැටුපට ළමයෙකු තබා ගැනීම තුළ මෙහෙකාරයෙකු තබා ගැනීමේ පන්තිමය අවශ්‍යතාවය ඉටු වේ. ඒ තුළ ළමයාගේ ළමා කාලය අහිමි වනවා පමණක් නොවේ. පහළ පංතියෙන් මධ්‍යම පන්තියට සංචලනය වන පුද්ගලයාගේ ආරෝපිත මානසිකත්වය තරවටු කරන්නේ ළමයාට ය. ඒ ඔවුන් පන්ති සංක්‍රමණය තුළ බලය විදහා දක්වන අවස්ථාව කි.

ළමා අපයෝජනයට සමාජයේ වැඩි වශයෙන් වගකිව යුත්තේ මාධ්‍යයයි. සමාජ වෙබ් අඩවි හරහා තිල් චිත්‍රපට හරහා ළමා මනස

දූෂිත වේ. ලිංගික රෝග සම්ප්‍රේෂණය අවම වීම හා ග්‍රාහකයන්ගේ තෘප්තිය ඉහළ මට්ටමකට ළඟා කර වීමට ළමයාට හැකි බැවින් ළමා ගණිකා වෘත්තිය තුළ වැඩි තැනක් හිමි වේ. මේ තුළ සිදුවන හානිය සහ ළමයාට ඇති වන පීඩනය ඔහු පිට කරන්නේ සමාජ සංස්ථාවට ද හානියක් කරමිනි. ඒ තුළ ඔහු ගේ හෝ ඇය ගේ අනාගතය අඳුරට ඇද වැටෙන අතර ළමා කාලය ඔහුට හෝ ඇයට අහිමි වේ. සමාජානුයෝජනය තුළ අපරාධකාරි මානසිකත්වයක් ඇති පුද්ගලයෙකු සමාජ ගත වීම තුළ සමාජ පර්යාස බිඳ වැටීම සාමාන්‍ය දෙයකි. දුගී බව, මුඩුක්කු, හා වීදි සංස්කෘතිය, දෙමවුපියන්ගේ වැරදි ක්‍රියා පිළිවෙත් සහ වැරදි සමාජ භාවිතයන් ළමයින් අපයෝජනයට ලක් වීමට ප්‍රබල හේතුව කි.

ළමුන් අපචාර වලට ලක් වීමට ප්‍රධනතම හේතුවකි, දෙමවුපියන් විදේශගත වීම. විශේෂයෙන් මවගේ රැකවරණය අහිමි වීම තුළ විසංවිධානකාරි වන පවුල් සංස්ථාව තුළ ළමයාට ඔහුගේ භූමිකාව අහිමි වන අතර සමහර අවස්ථාවල වැඩිමහල් දියණියක් නම් මවගේ භූමිකාව රඟ පෑමට ද තවත් විටෙක පියාගේ හෝ අසල්වැසි සල්ලාලයන්ගේ ලිංගික අවශ්‍යතාවන් ඉටු කර දීමට ද සිදු වේ.

එසේම නිවස තුළ ඇතිවන අඩදබර තුළින් මානසික වශයෙන් ළමුන් කම්පනයට පත් වේ. තව ද නූගත්කම, බීමත්කම වැනි සංසිද්ධීන් ළමා අපයෝජනය කෙරෙහි බලපායි.

මාවත් වාසී දරුවන් හෙවත් වීදි දරුවන් ලංකාව තුළ ප්‍රබල ගැටලුවකි. සෑම ප්‍රධාන නගරයක් ආශ්‍රිතවම විශේෂයෙන් බස් නැවතුම්, වෙරළ තීරයන් අසල සකස් කරගත් කුඩා පැල්පත්, ප්‍රසිද්ධ උද්‍යානයන් දක්නට ලැබේ. අවිවාහක මාතෘත්වය, වීදි ගණිකාවන්ගේ වැඩි වීම, වීදි ළමයින්ගේ වර්ධනයට හේතුවයි. මෙය අනාගත පරපුරේ ඛේදවාචකය යි. බොහෝ විට වැඩි වියට පත් වූ පසු අපරාධකාරි චර්යාවන්ට යොමු වන්නේ මෙම වීදි දරුවන් ය. ඔවුන් ලබන දුෂ්සමාජානුයෝජනය මෙම සමාජ අපගමනකාරී ක්‍රියාවන්ට හේතුවයි. ඒ තුළ වීදි ගණිකා වෘත්තිය තහවුරු වන අතර මත් ද්‍රව්‍ය අලෙවිය හා සිඟමන් යැදීම වැනි සමාජ විරෝධී ව්‍යාපාරයන්ගේ මුල්තැන මෙම දරුවන්ට හිමි වේ. ඒ අනුව ළමා අපරාධකරුවන් සමාජයට විවෘත වන්නේ මේ තුළිනි. මෙය දිළිඳුකම හේතු කොට ගෙන සිදුවන හා සිදු කරන ළමා අපයෝජනයන් ලෙස සරලව හැඳින්විය හැකි ය.

ලිංගික අපයෝජනයට පත් වූ දරුවන් දුර්වල වන්නේ ශාරිරිකව පමණක් නොවේ. ඒ තුළ ඇති වන මානසික බිඳ වැටීම සමාජ කම්පනය ළමයා කායික මානසික වැඩීමට නිශේධනාත්මකව බලපායි. ශාරීරිකව තුවාල ඇති වීම, ලිංගික රෝග, ඇති වීම වැනි දේ ද මානසිකව වේදනා විඳීමට ව්‍යාකුලත්වය, හීනමානය, කාන්සිය, හුදකලාව යනාදිය ද සමාජීය වශයෙන් සමස්ත සමාජයට වෛර කිරීම හා සමාජානුයෝජනය තුළ වැරදි ක්‍රියාවලට යොමු වීම අන් පුද්ගලයන් සැක කිරීම යනාදි කායික මානසික ලක්ෂණ හඳුනාගත හැකි ය.

බොහෝ විට දරුවන් අපයෝජනයට ලක් වන්නේ පාසල, ක්‍රීඩා පිටිය, වෙරළ තීරය, ලඳු කැලෑ, පාළු ස්ථාන, පාළු පාරවල්, අසල්වැසි නිවාස, ඥාති නිවාස, බස් නැවතුම් පල, තමන්ගේ නිවස, පූජ්‍ය ස්ථානවල, පාසල් වෑන් රථ වැනි ස්ථාන වලය.

බොහෝ විට දරුවන් අපයෝජනයට ලක් කරන අපයෝජකයන් බිහි වන්නේ මත් ද්‍රව්‍ය භාවිතය, අවිවාහක බව, අවිවේකී බව නිසා ඇති වන මානසික හුදකලා බව, ලිංගික පීඩනය, යහපත් ළමා කාලයක් නොතිබීම, වැනි හේතු සාධක හේතුවෙනි.

හඳුනාගනු ලැබූ ළමා අපයෝජනයට හා අපචාර සඳහා ස්ථිර සාර විසඳුමක් අවශ්‍ය වේ. ඒ සඳහා බිම් මට්ටමේ සිට ජාතික තලය දක්වා සෑම අංශයක් කෙරෙහිම අවධානය යොමු කරමින් ප්‍රතිපත්ති සැකසිය යුතුය. මෙහිදී ළමා අපචාර සම්බන්ධව පාර්ලිමේන්තුව වැනි නීති සම්පාදන ආයතන විසින් තීරණ ගත යුතු අතර එහිදී ළමා අපයෝජනය සම්බන්ධයෙන් නීති ක්‍රියාත්මක කළ යුතුය.

එමෙන්ම ළමයින් පිළිබඳව සංවේදී හැඟීම් සමාජ කතිකාවකට භාවිත කළ යුතුය. එය බිම් මට්ටමෙන් ඇරඹීම තුළ ළමා පරපුර මෙන්ම වැඩිහිටි පරපුර ද දැනුවත් කිරීම අතිශය වැදගත් ය. අපයෝජනයට ලක්වූ දරුවකු සමාජ ගත කිරීමේ දී දරුවා පිළිබඳ සමාජය තුළ සුභවාදි ආකල්පයක් ඇති කරන්නට සමත් වීම තුළ ළමයා මානසික පීඩනයෙන් වළක්වා ගත හැක. දරුවා තුළ තමා පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීමටත් අපයෝජනයට ලක් වීමට ඇති අවස්ථා හඳුන්වා දීමත් සිදු විය යුතු ය. එහි වගකීම පවුලේ සමාජිකයන්ට හා පාසලට හිමි වේ. මෙම ආයතන දෙක විසින් මෙම පැහැදිලි කිරීම සිදු කළ යුතුය. එසේම පවුලේ වැඩිහිටියන්ගේ ර කවරණය සහ ආදරය ළමුන් වෙනුවෙන් ලබා දීම තුළ වැරදි ක්‍රියාවලට යොමු වීම වළක්වාල යි.

ළමා අපචාරවලට ළමා මනස පොළඹවන කාරකයන් ඔවුන්ගෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය. එහි දී අන්තර්ජාල භාවිතය තුළ සමාජ වෙබ් අඩවි තුළ සැරි සැරීම වැනි කාරණාවල දී සැලකිලිමත් විය යුතු ය. මන්ද බොහෝ විට මෙම වෙබ් අඩවි හරහා හුවමාරු වන්නේ ළමා මනසට නුසුදුසු රූප රාමු සහ අදහස් ය. තව ද නිල් චිත්‍රපටි අලෙවි සැල් වැටලීම නිරන්තරයෙන් සිදු කිරීම හා ඊට අදාළ පුද්ගලයන් නීතියේ රැහැනට නතු කර ගැනීම තුළ බොහෝ ගැටලු අවම කරගත හැකි ය. තව ද ළමයින්ට එරෙහිව කරන අපරාධ සඳහා ක්‍රියාත්මක වන නීති පිළිබඳව සමාජය දැනුවත් වීම තුළ අපරාධ වලට යොමු වන ප්‍රතිශතය අවම කර ගත හැකි ය. බොහෝ පුද්ගලයන් ඊට යොමු වන්නේ නොදැනුවත් ය. එහිදී ප්‍රධාන වශයෙන් මෙම නීතියේ කොටස් 05 ක් හඳුනා ගත හැකි ය.

1. ළමයින්ට එරෙහිව සිදු කරනු ලබන වැරදි වලට අදාළ නීති.
2. ළමයින් සේවයේ යෙදවීමට අදාළ නීති.
3. බාල අපරාධකරුවන් පිළිබඳව යුක්තිය පසිඳලීමට අදාළ නීති.
4. භාරකාරත්වය නඩත්තුව රැකවරණය උප්පැන්න ලියාපදිංචි පුරවැසිභාවය වැනි පවුල් නීතිය පිළිබඳ ක්ෂේත්‍රයට ඇතළත් වන නීති.
5. සිවිල් හා අපරාධ උසාවි කාර්ය පටිපාටියට අදාළ නීති.
   (ළමා අංශය, මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදී සංවිධානය.)

මෙම නීති බලාත්මක කරලීම තුළ සමාජයේ ඇති වී තිබෙන අර්බුදකාරි තත්ත්වය යම් තරමකට අවම කරලීමට හැකි ය. ගෝලීය වශයෙන් ආර්ථික සමාජ වටපිටාව හසුරුවන තුන්වන ලොකයේ රටවල් විසින් රටක අනාගත කොඳු නාරටිය වන ළමා පරපුර රැක ගැනීමට පුළුල් ලෙස ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා පහත පරිදි ළමයින්ට අදාළව නීති සම්පාදනය වී ඇත. ශ්‍රී ලංකාවේ ළමයින්ට අදාළ පහත ආඥාපනත්වල නීති සඳහන් ය.

1. 1995 අංක 22 දරන පනතින් සහ 1998 අංක 29 දරන පනතින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහය.
2. 1939 අංක 48 දරන ළමා හා යෞවන ආඥා පනත සහ එහි සංශෝධන.
3. 1841 පාදඩ ආඥා පනත සහ එහි සංශෝධන.
4. 1956 අංක 04 දරන ළමා හා යෞවන (හානිකර ප්‍රකාශන) පනත.

5. 1927 අංක 4 දරන අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත.
6. 1995 අංක 20, අංක 19 සහ 1998 අංක 28 දරන පනත් වලින් සංශෝධිත අපරාධ නඩු විධාන සංග්‍රහ පනත.
7. 1979 අංක 38 සහ 1992 අංක 15 දරන පනත් වලින් සංශෝධිත ළමයින් තුළ වැද්දීමේ ආඥා පනත.
8. 1964 අංක 43, 1973 අංක 29 සහ 1984 අංක 32 දරන පනත් වලින් සංශෝධිත 1956 අංක 47 දරන කාන්තාවන්, යෞවනියන් හා ළමයින් සේවයෙහි යෙදීමේ පනත සහ ඒ යටතේ පනවා ඇති රෙගුලාසි.
9. 1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස ගත කිරීම පිළිබඳ ආඥා පනත සහ එහි සංශෝධන.
10. 1944 අංක 22 දරන අනාථ නිවාස ආඥා පනත.
11. 1939 අංක 28 දරන තරුණ වරද කරුවන් (පුහුණු පාසල්) පිළිබඳ ආඥා පනත.
12. 1951 අංක 17 දරන උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනත.
13. 1980 අංක 53, 1977 අංක 20 හා 1977 අංක 19 දරන පනත් මගින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහය.
14. 1955 අංක 18 හා 1997 අංක 12 දරන පනත් වලින් සංශෝධිත 1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ආඥා පනත සහ 1995 දරන 19 පනතින් සංශෝධිත 1952 අංක 44 දරන උඩරට විවාහ හා දික්කසාද පනත.
15. 1972 අංක 19 1978 අංක 2 හා 1999 අංක 32 දරන පනත් වලින් සංශෝධිත 1889 අංක 19 දරන නඩත්තු ආඥා පනත.
16. 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනත් සහ ඒ යටතේ පනත ඇති අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි.
17. 1848 අංක 20 දරන ආගමන හා විගමන පනත හා එහි සංශෝධන.
18. 1979 අංක 4 දරන බීමත්කම යටතේ සිදු කරන වැරදි පිළිබඳ වැරදි.
19. 1998 අංක 27 හා 1979 අංක 37 දරන පනත් වලින් සංශෝධිත 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත.
20. 1989 අංක 17 දරන පනතින් සංශෝධිත 1965 අංක 07 දරන වයස පූර්නත්ව ආඥා පනත.

(ළමා අංශය, මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදී සංවිධානය පි. 1, 2)

ඉහත සඳහන් අන පනත් මගින් ළමා අයිතිවාසිකම් තහවුරු කරමින් ළමුන් අපයෝජනයට හා අපචාරවලට පෙලඹවීමේ අවස්ථාවන් ආවරණය කර ඇත.

එසේම ළමයා යනු අවදානම් කාල පරිච්ඡේදය කි. ඔහුට සමාජ අත්දැකිම් අත්විදීම් අවම ය.ඒ තුළ අනතුරු, ආපදා සහ අපයෝජනයන්ට ගොදුරු වීමේ අවදානම වැඩි ය. ඔවුන් කුමන සාධකයක් මත අපචාර වලට පෙලඹුණ ද සමාජ සාධක හේතු කොට ගෙන අපයෝජනයට ලක් වුව ද අවසාන වශයෙන් සමාජ ගත වන්නේ බිඳුණු පෞරුෂයකින් යුක්ත දරුවෙකි. ඔහු නිසි වයසට පත් වූ පසු ක්‍රියා කරන්නේ කුඩා කළ ලත් අත්දැකීම් අනුසාරයෙනි. එවන් දරුවෙකුගෙන් යහපත් සමාජ චර්යාවක් අපේක්ෂා කළ නොහැකි ය. ඒ හේතුවෙන් ලංකාව තුළ ළමා අපයෝජනය හා අපචාර සම්බන්ධව මීට වඩා අවධානය යොමු කළ යුතු අතර ඒ තුළ අනාගත පරපුර මුහුණ දෙන අවාසනාවන්ත තත්ත්වයෙන් වැළකිය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ සහ සඟරා

1. කුරේ, නිරංජන්, ක්‍රිශාන්ත (2005), ශ්‍රී ලංකාවේ සිදු වන අපයෝජන, කොළඹ 08, විදුර ප්‍රකාශන
2. ජසින්තා, ඇන්ටමාරි, (2006), ළමා වර්ධන පරිකල්පනය හා නිර්මාණශීලිත්වය, කොළඹ 08, පහන් ප්‍රකාශකයෝ
3. නිශ්ශංක, චන්දිමා, (2004), ජනමාධ්‍ය ප්‍රචණ්ඩත්වය සහ ළමා අයිතිවාසිකම්, කොළඹ 10, වාස් ගොඩගේ සහ සහෝදරයෝ
4. සේනානායක, හර්ෂණ, (2006), දරුවන් මුහුණ දෙන ලිංගික අතවර සහ අපයෝජන
5. රත්නපාල, නන්දසේන, (2007), අපරාධ විද්‍යාවේ මූලධර්ම, වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ
6. රසකැන්, බෙන්, (1995), බාල අපචාරය, කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ
7. Adler, Freda, Mueller o.w Gerhard Lauter S Williaum (2013) riminiology Fourth Edition
8. iegelo, I Larry eight edition criminology Lowell University of Mass Chusetts
9. ලෝකයේ වෙසෙන දරුවාගේ තත්ත්වය (2013), යුනිසෙෆ් එක්සත් ජාතින්ගේ ළමා අරමුදල , ළමා අපයෝජනය සහ නීතිය, ළමා අංශය මානව හිමිකම් සහ සංවර්ධනය පිළිබඳ නීතිවේදි සංවිධානය